**ගලේවෙල ප්‍රාදේශීය සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**

---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 16 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජනවාරි  දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

----------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ගලේවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ගලේවෙල ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ වෙන්දේසි කරන ලද රු.1,615,000ක් වටිනා යන්ත්‍ර සූත්‍රවල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ). මස්කඩ කුලී වෙනුවෙන් ලැබී තිබුණු රු.80,216ක් වූ චෙක්පත් 04 ක් අගරු වී තිබුණු අතර, වර්ෂය අවසානයට වූ හිඟ ශේෂයට එම වටිනාකම ඇතුළත් වී නොතිබුණි.

(ඇ). ස්ථාවර වත්කම් ගිණුම්වල එකතුව සමඟ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය සමාන විය යුතු වුවද, එම ශේෂ දෙක අතර රු.2,306,909ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට එක් බැංකු ජංගම ගිණුමක ශේෂය රු.100,000ක් අඩුවෙන් ශේෂපත්‍රයේ දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.2,054,440ක ශේෂය ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්
------------------------------

ගිණුම් විෂයයන් 06කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු. 25,245,860ක වෙනසක් නිරික්ෂණය විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
--------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතුවරු.44,118,879ක් වූ අතර, වසර 5ක කාලයක් ඉක්මවූ එකතුව රු.782,897ක් වූ ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
--------------------

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය හිමි ශේෂවල එකතුව රු.37,947,579 ක් වූ අතර, වර්ෂයට වැඩි කාලයක් ඉක්මවූ රු.19,842,787ක කර්මාන්ත ණය හිමි ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.238,526,877ක් වූ ශේෂයක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති,රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 126 වගන්තිය | අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර නොගෙන විෂයයන් 04 ක් යටතේ රු.285,004ක ආදායම් උපයාගෙන තිබුණි. |
| (ii) 19(i) වගන්තිය | යොමුගත නියමයන්ට අනුකූල නොවි සේවකයින් 26 දෙනෙකු සේවයේ යොදවා රු.3,354,192 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ1646 දරන රෙගුලාසිය | සභාව සතු වාහන 08කට අදාළ දෛනික ධාවන සටහන් පත් සහ මාසික කාර්ය සාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එම වාහන වෙනුවෙන් රු.1,499,759ක ඉන්ධන වියදම් දරා තිබුණි. |
| (ඇ) 1990 ඔක්තෝබර්10 දිනැති අංක41/90 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදි සභාව සතු වාහන 13ක ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. |
| (ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ. | |
| (i) 2013 මාර්තු 23 දිනැති අංක 3/2/2/4 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය. | නියමිත සීමාව ඉක්මවා රු.14,824ක දුරකතන දීමනා උපසභාපතිවරයාට ගෙවා තිබුණි. |

(ii) 2013 අප්‍රේල් 05 දිනැති අංක 01/2013 දරන චක්‍රලේඛය.

- 01 හා 03 ඡේද — සභාපතිවරයාට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු.12,500ක ඉන්ධන දීමනාවක් ද 2013 අප්‍රේල් 26 දින ලබා දී තිබූ මහා සභා තීරණය මත 2013 අප්‍රේල් මාසය සඳහා සහා මන්ත්‍රීවරුන් 15 දෙනෙකුට රු.37,500 ක ඉන්ධන දීමනා ද චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ගෙවා තිබුණි.

- 04 ඡේදය — අදාල ධාවනයන් තහවුරු කිරිම සඳහා දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකරන ලද මන්ත්‍රීවරුන් 13 දෙනෙකුට රු.197,500 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,562,387ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,412,057ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.849,670ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අදායමට අතිරික්තය සියයට 9.15 ක අගයක් ගෙන තිබුණු අතර, ඉකුත් වර්ෂයේ එම අගය සියයට 11.49 ක් වූයෙන් 2.34 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.3 ආදායම් පරිපාලනය

----------------------

2.3.1 වරිපනම් හා අක්කර බදු

---------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් හා අක්කර බදු ශේෂ පිළිවෙලින් රු.945,495ක් හා රු64,350ක් වූ අතර, එම ශේෂ වලට වර්ෂ 01ක කාලයක් ඉක්මවූ පිළිවෙලින් රු.287,104ක් හා රු.50,668ක ශේෂ ඇතුළත් විය.

2.3.2 විනෝද බදු

-------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට හිඟහිටි විනෝද බදු ශේෂය රු.6,948ක් වූ අතර , වර්ෂ 10ක කාලයකට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පැවතුණි.

2.3.3 බදුකුලී

---------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදුකුලී ශේෂය රු.146,811ක් වූ අතර එම ශේෂයට 2004 වර්ෂයට පෙර සිට අයවිය යුතු රු.84,581ක මස්කඩ කුලී ශේෂයක්ද ඇතුළත් වී තිබුණි.

2.3.4 බලපත්‍ර ගාස්තු

-----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බලපත්‍ර ගාස්තු ගිණුමේ ශේෂය රු.691,370ක් වූ අතර, එම ශේෂය වර්ෂ 06කට පෙර සිට ඉදිරියට ගෙනෙමින් පැවතුණි.

2.3.5 ජල ගාස්තු

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ගිණුමේ ශේෂය රු.407,239ක් වූ අතර , එම ශේෂය වර්ෂ 01ක කාලයක් ඉක්මවා පැවතුනි.

2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.3,213,250 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.10,108,464ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.4 අයිභාර

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂයකදී පනවන ලද අයිභාරවලට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට රු.226,000ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් 1979 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින රු.26,334ක හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුන තුළ ලැබී තිබු ගොඩනැගිලි අයදුම්පත් 197ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 34ක් සඳහා පමණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුළ බලපත්‍ර නිකුත් කළ යුතු වෙළෙඳසැල් 776ක් හඳුනාගෙන ඉන් වෙළෙඳසැල් 103ක් සඳහා පමණක් බලපත්‍ර ලබාදී තිබුණි. ඒ අනුව බලපත්‍ර ලබා නොගෙන වෙලඳසැල් 673 ක් ව්‍යාපාර කටයුතු කර තිබුණි.

(ඈ). ජල ව්‍යාපෘතියට අදාල බැංකු ජංගම ගිණුම රු.108,749ක ශේෂයක් සහිතව 2011 වර්ෂයේ සිට අක්‍රියව පවත්වා තිබුණි.

(ඉ). (i) 2013 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි සඳහන් ඉකුත් වර්ෂ 03 කදි ලැබී තිබුණු රු.92,817 ක අගරු චෙක්පත් 04 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) ඉන් රු.66,299 ක් වටිනාකමැති අගරු චෙක්පතට අදාළ මුදල ඊට වගකිවයුතු නිලධාරියාගෙන් අයකිරිමට 2010 ජුනි 24 දින මහා සභාව විසින් තීරණය කර තිබුණු නමුත් ඊට අනුකූලව අයකිරීම් කර නොතිබුණි.

(ඊ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට ලැබිය යුතු පෙර ගෙවුම් ශේෂවල එකතුව රු.3,391,897ක් වූ අතර, ප්‍රාදේශීය සභාව ස්ථාපනය කළ කාලයේ සිට ඉදිරියට ගෙන එන රු.3,381,897ක ශේෂයන්ද, ඇතුළත්ව තිබුණු නමුත්, නිරවුල්කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයට අදාළව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 24ක ඌනතාවයක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(ඌ) සභාවේ අනුමත කළ ගාස්තු අය නොකර ටී.බී.තෙන්නකෝන් අනුස්මරණ රංග ශාලාව අවස්ථා 18 කදී කුලියට දීම නිසා සභාවට රු.19,500ක ආදායම් අහිමි වී තිබුණි.

3.2 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

---

තක්සේරු වටිනාකම රු.82,600ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 10ක් වසරකට වඩා කාලයක සිටද, වටිනාකම රු.579,000ක්වූ ට්‍රැක්ටර් 2ක් වසර 04කට වඩා කාලයක සිටද නිශ්ක්‍රීයව හෝ ඌන උපයොජිතව පැවතුණි.

3.3 කොන්ත්‍රාත් පාලනය

---

සමාලෝචිත වර්ෂයේ ඉටු කරන ලද කර්මාන්ත සම්බන්ධව කරන ලද විගණන පරීක්ෂණයේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | කර්මාන්තයේ නම | ඇස්තමේන්තු මුදල හා ප්‍රතිපාදන ප්‍රභවය | ස්ථානීය පරික්ෂා කළ දිනය | | නිරික්ෂණ |
|---|---|---|---|---|---|
| (අ). | පහළවැව පල්ලම්යාය පාර බොරළුඅතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තය. | රු. 329,487 පොදු අරමුදල්. | 2013.12.03 | i. | ආරම්භයේ සිට මීටර් 200ක පමණ දුරක වලවල් හැරී මාර්ගය ඉතා දුර්වල තත්ත්වයක පැවතුණු අතර, නියමිත ප්‍රමිතියෙන් යුතු බොරළු නොයෙදීම නිසා සේදී ගොස් තිබුණු මාර්ගයේ මතුපිට අඟල් 9 පමණ ප්‍රමාණයේ විශාල ගල් නිරාවරණය වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ). | බුලනවැව පල්ලිය ඉදිරිපිට පොදු පාරේ පැති අරමුදල් බැම්ම ඉදිකිරීම. | රු.150,000 | 2013.12.03 | පැති බැම්ම මත අඟල් ½ ක් ඝනකමට යෙදිය යුතු බදාම තට්ටුව අඟල් ¼ ක ප්‍රමාණයෙන් යෙදීම නිසා ස්ථාන 05 ක සිමෙන්ති තට්ටුව පුපුරා තිබුණු අතර, එම වර්ග මීටර් 11.67 ක් වෙනුවෙන් රු.7,970 ක් ගෙවා තිබුණි. |
| (ඇ). | මීවලපතහ පාර කැටගල් මහනැගුම ඇල්ලීමේ කර්මාන්තය i හා ii අදියර. | රු.1,000,000 | 2014.11.18 | i. කොන්ක්‍රීට් කැටගල් ඇතිරීමට පෙර, මාර්ගයේ ආරක්ෂිත බැමි සඳහා නියමිත මිශ්‍රනයෙන් කොන්ක්‍රීට් යොදා නොමැති බව ස්ථාන කිහිපයක් කඩා පරීක්ෂා කිරිමේදි දක්නට ලැබුණි.<br>ii නියමිත ප්‍රමිතියෙන් යුත් කොන්ක්‍රීට් කැටගල් මාර්ගයේ අතුරා නොතිබුණි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
-------------------------

1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය සහ මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර , විගණන හා කළමනාකරණ කමිටුද පිහිටුවා නොතිබුණි.

4.2 අයවැය පාලනය

--------------------

(i) ආදායම් විෂයයන් 5 ක ඇස්තමේන්තුගත රු.1,605,000ක ආදායමෙන් කිසිදු මුදලක් උපයාගෙන නොතිබුණු අතර, තවති ආදායම් විෂයයන් 21 ක ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් අතර විචලනය සියයට 11 සිට සියයට 94 අතර පරාසයක විචලනයන් පැවතිණි.

(ii) වැය විෂයයන් 13 ක ප්‍රතිපාදන ඉතිරවීම් සියයට 05 සිට සියයට 95 දක්වා වූ පරාසයක පැවතුණු අතර, එක් වැය විෂයක මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයම මාරු කිරිමෙන් අනතුරුව නැවත පරිපූරක මඟින් නැවත සපයාගත් ප්‍රතිපාදනයෙන්ද සියයට 93ක් ඉතිරි

කර තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
---------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අභ්‍යන්තර පාලනය.

(ඇ). මූල්‍ය පාලනය.

(ඈ). අයවැය පාලනය.

(ඉ). ආදායම් පරිපාලනය

(ඊ). වත්කම් කළමනාකරණය

(උ). ණයගැති හා ණයහිමි පාලනය